

# සන්නස

**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.net
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
email- sjturaus@optusnet.com.au

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

වැදගත්

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කා රකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න
සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

## ලියා දන්වන වග

### මේ අවුරුදු කාලේ - අලුත් වෙයන් රාලේ

සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද යනු සාමයේ සහ සහජීවනය පිළිබඳ වැඳගත් කම අපේ සිත් තුළට එක් කරන කාලයයි. වසරක් අවසානයේ තම අසල්වැසියා දෙස යළිත් වතාවක් නැවුම් හැඟීමකින් හැරී බලන්නට පොළඹවන මේ කාලය සමාජයීය වශයෙන් වැදගත් වන්නේ ඒ නිසාම යයි සිතෙයි. විරුද්ධවාදීකම් කුහක කම් ආදී දහසකුත් එකක් හැඟීම් යටපත් කරගන්නට මිනිසුන් පොළඹවන මේ අවුරුද්ද හුදු විනෝදය සපයන කාලයකට වඩා සමාජය යහපත් තැනක් කරන පෙළඹවීම ඇති කරන කාලයක් වෙයි.

එනිසාම සමාජය දෙස නැවුම් ඇසකින් බලන්නට සූදානම් වන්නැයි අපි ඔබෙන් ඉල්ලා සිටිමු. සමාජයක් ලෙස ඉදිරියට යන්නට අලුත් අවුරුද්ද අපට උපකාර වන්නේ එවිටය.

**සන්නස පාඨක ඔබ සැමට සුබ අලුත් අවුරුද්දක් වේවා**



## ගිරුවා පත්තුවේ මාතෘ භූමියට වඩා ශ්‍රී ලංකා මාතෘ භූමියේ සංස්කෘතිය අති විශිෂ්ඨය.

නීතිඥ චන්ද්‍රසිරි සෙනෙවිරත්න

මහින්ද රාජපක්ෂ නැවත තමන්ට රට බාර දෙන ලෙස ඒකාබද්ධ විපක්ෂ රැස්වීමේදී ඉල්ලා සිටියේය. එක්නැලිගොඩ ඝාතන සිද්ධියේ සැක කරුවන්ට ඇප දෙන කතාව ඇසූ සැනෙන් සන්ධ්‍යා එක්නැලිගොඩ කීවේ කුමක්ද? ඒ ක්‍රියාව තම ජීවිතයට තර්ජනයක් බවය. ඒ ඇයිදැයි මෙහිදී සාකච්ඡා නොකර දකුණු පළාත් අමාත්‍ය ඩී.වී. උපුල් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේනුවේ නිලධාරින්ට ගල් ගසා මරණ බව කී බව පමණක් මෙහිදී සිහිපත් කළ හැකිය. මහින්දට රට භාරදෙයි නම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේනුවේ නිලධාරින්ටද සන්ධ්‍යා එක්නැලිගොඩ කී දේම කියන්ට සිදුවනු නිසැකය. එක්නැලිගොඩ ඝාතන සිද්ධියේ සැක කරුවෝ මහින්දට අනුව රණ විරුවෝ වෙති. මහින්ද නැවත රට භාර ගත්විට අපරාධ කරන රණවිරුවන්ට අභය දානයද, අපරාධ පරීක්ෂණ සිදු කරන නිලධාරින්ට මරණයද හිමි වේ. අත් අඩංගුවේ සිටින රණවිරුවන් සහ භික්ෂූන් අවුරුද්දට පෙර නිදහස් නොකලොත් බලා ගන්නා බවට රාවනා බලය ආණ්ඩුවට තර්ජනය කරයි.සංඛ්‍යාවෙන් ගත්කළ රණ විරුවන් සහ බෞද්ධ භික්ෂූන් රටේ ජනගහනයෙන් 5% නැත. එතරම් අතලොස්සක් මෙසේ අරගල තර්ජන කරන්නේ මහින්ද රාජපක්ෂ වෙනුවෙනි.

මහින්ද රාජපක්ෂ බලයෙන් පහකොට එකී මාර්තු 17දාට එක් අවුරුදු තුන් මසකි. මේ කාලය තුල යහ පාලන ආණ්ඩුව කුමක් කළේදැයි ඒකා-බද්ධ විපක්ෂය ප්‍රශ්න කරයි. මුලින් කීවේ කෝ හොරු ඇල්ලුවාද කියාය. දැන් කියන්නේ දේශපාලන පලිගැනීම් කරනවා කියාය. සාධාරණ පරී-ක්ෂණයක් විනිශ්චයක් ආප්ප බානවා මෙන් හෝ අගවිනිසුරුවරිය එළවූ ආකාරයට කළ නොහැකිය.

ජනතාව මහින්ද රාජපක්ෂ පරාජය කළේ පෙරේත පාදයෙන් නොවේ. ලක්ෂ හතරක පරතරයක් වාර්තා කරමිනි. මහින්ද පැරදුණේ මහින්ද චින්තන පාලනය ජනතාවට දිරවාගත නොහැකිවූ නිසාය. මහින්දගේ පාලනය නිසා පළමුව, රටේ ප්‍රජාතන්ත්‍රවාදය අක්‍රිය විය. දෙවනුව

12 වන පිටට